# චමිදු ගිය
# ලස්සනම ගමන



මද්‍යසාර සහ
මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ
**ප්‍රකාශනයක්**

ADIC
Alcohol and Drug Information Centre

## මවකමෙන් සෙනෙහස පුදන්නට තරම් සිත්ඇති පෙර පාසල් ගුරු මෑණිවරුන් උදෙසා............

දරුවන් කුඩා කල සිට මද්‍යසාර, දුම්වැටි වලට හුරු කිරීම උදෙසා ක්‍රියා කරන එම සමාගම් වල උපක්‍රම වලට දරුවන් තුල ප්‍රතිශක්තිකරණය ඇති කිරීමේ අරමුණෙන්, පෙර පාසල් ගුරුවරුන්ට මෙම කතාන්තර දරුවන්ට කියා දිය හැකි ආකාරයට මෙම පොත නිර්මාණය කර ඇත.

දරුවන් ආස කරන සුරංගනා චරිතයක්වටා මෙම කතාන්තරය ගොඩනැංවී ඇත.

දරුවන් මෙම කතාන්තරය සවන් දීමේ දී ගංගා ,දියඇලි ,ලස්සන කුරුල්ලන් ,කඳුවැටි යන පරිසරයේ ස්වාභාවික දේ මනසින් දැකීමට අවස්ථාව උදාකර ඇත.

සතුටු වීම සඳහා උත්සව අවස්ථාවන් වලට අරක්කු තිබිය යුතු යැයි දරුවන්ගේ සිත්තුලට සමාජයෙන් ඇතුල් කරවන වැරදි ආකල්පය නිවැරදි කිරීම සඳහා මෙහිදී උත්සාහ කර තිබේ.

දරුවන්ට ජීවිතයට වඩාත් වටිනා පණිවිඩයක් වන උත්සව වලට අරක්කු ගෙනාවෙ නැත්නම් හැමෝටම සතුටින් ඉන්න පුළුවන් බවත් අරක්කු වලින් සතුට නැති වන බවත් පෙන්වාදීම මෙම කතාව තුලින් බලාපොරොත්තුවේ.

---

ඔබගේ අදහස් අපට වැදගත්

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org

**චිත්‍ර නිර්මාණය** -
තේජා දෙහිවත්ත

**පිටු සැකසුම** -
හර්ෂණ නිමලසූරිය

**සංකල්පය** -
මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)

දිල්කි අක්කලාගෙ ගෙදර උත්සවයට යන්න හෙට උදේම නැගිටින්න කියලා අම්මා කිව්ව එක චමිදුට මතක් වුණා.

ඒ නිසා වේලාසනින් නිදාගන්න ඇඳට ගිය චමිදු උත්සවය ගැන හිතමින් නින්දට ගියා.



උත්සවයට යන්න ආසාවෙන් ම නින්දගිය චම්දුට නින්ද යනවාත් එක්කම ඈතින් සමනලයෙක් ඉගිල්ලිලා එනවා වගේ පෙනුණා.

ලස්සන සමනලයෙක් මම කවදාවත් දැකලා නෑ මේ වගේ лොකු සමනලයෙක් චම්දුට හිතුණා.

සමනලයා එළියක් විහිදුවමින් ටිකෙන් ටික චම්දු ළඟට එන බව චම්දුට පෙනුණා.

මේ සමනලයෙක් නෙවෙයි නෙ මම කතා පොත්වල දැක්කා වගේ ලස්සන සුරංගනාවියක් නේ චම්දුට හරිම සතුටක් දැනුණා.

ආසාවෙන් සුරංගනාවි දිහා බලන් ඉන්න චමිදු ළඟටම සුරංගනාවි ආවා.


"මගෙත් එක්ක  ඇවිදින්න යන්න ඔයා කැමති ද? "සුරංගනාවි චමිදුගෙන් ඇහුවා.



“ඔව් මම හරිම කැමතියි ”චමිදු උත්තර දුන්නා.

සුරංගනාවි චමිදුගේ අතින් අල්ලා ගත්තා ඊට පස්සෙ චමිදුට වෙනසක් දැනුණා.

අනේ මම සුරංගනාවිත් එක්ක පාවෙලා යනවා නේ චමිදු පුදුමයට පත්වුණා.



ලස්සන පාට පාට මල් ,දියඇලි,
ලස්සන කුරුල්ලො පෙන්වමින්
කඳුවලට ඉහළින් චමිඳුව එක්කන්
සුරංගනාවි පාවෙලා ගියා.

මෙහෙම යන අතරේ ලස්සන
තැනක චමිදුත් එක්ක සුරංගනාවි
නැවතුණා.

ලස්සන සැරසිලි , පාට පාට බැලුන්
බෝල, ලස්සනට ඇඳගෙන සතුටින්
ඉන්න නැන්දලා මාමලා චමිදුට
දකින්න පුළුවන් වුණා.




ලස්සන බලමින් එහාට මෙහාට ඇවිද
යන චමිදු දිහා සුරංගනාවි බලන්
හිටියා.



සතුටින් ඇවිදන් ගිය චමිදු
එකපාරටම පුදුමයෙන් වගේ
නැවතුණා.

මේසය උඩ පුරවලා තිබුණ කෑම
ජාති දැකලා "අම්මෝ ... තියන කෑම
ජාති ගොඩ "චමිදුට ඉබේටම
කියවුණා.



තව ටිකක් ඉදිරියට ඇවිදන් ගිය චමිදුට ලස්සන නැටුමක් දකින්න පුළුවන් වුණා.

පුංචි ළමයි ලස්සනට නටනවා



නැන්දලා මාමලා සතුටින් නැටුම
දිහා බලන් ඉන්නවා දැකලා
චමිදුටත් නටන්න තිබුණා නම්
හොඳයි කියලා හිතුණා.

"උත්සවයේ හැමෝම සතුටින්
ඉන්නවා එහෙම වෙන්නෙ
කොහොමද ?"

කියලා සුරංගනාවි ළඟටම ගිහින්
චමිදු ඇහුවා.




"මේ උත්සවයට අරක්කු ගෙනල්ලා නැනෙ ඒක නිසා කවුරුවත් ම අරක්කු බීලා නෑ ඉතින් හැමෝම සතුටින් ඉන්නවා" සුරංගනාවි චමිදුට කියලා දුන්නා.



"උත්සවයට අරක්කු ගෙනාවෙ නැත්නම් හැමෝටම සතුටින් ඉන්න පුළුවන් කියලා මම මගේ යහළුවෝ හැමෝටම කියලා දෙනවා"

චමිදු සුරංගනාවිත් එක්ක සතුටින් කිව්වා.



"උත්සවයට අරක්කු ගෙනාවෙ නැත්නම් හැමෝටම සතුටින් ඉන්න පුළුවන් කියලා ඔයා හැමෝටම කියලා දුන්නොත්, මම වගේම ඔයාටත් ලස්සන වෙන්න පුළුවන් "

සුරංගනාවි චමිදුට කිව්වා.







ADIC
Alcohol and Drug Information Centre

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org